


බණ්ඩාරනායක මහතා

"පුරාණ ගමකින් මහවැලි ගමකට. ඉස්සර වගේ නෙවෙයි. ගමේ හැමෝටම ඉඩම්, ආදයම්, කාටත් තම තමන්ගේ දුක සැප බලාගන්න පුළුවන් ජීවන තත්වයක් මහවැලියෙන් උදවුනා. කලින් අක්කර දෙළහකින් ගත්තට වැඩි ආදයමක් අක්කර දෙකෙන් ගන්නවා."

# අක්කර දෙළහට වැඩිය දෙකහමාර හොඳයි

මහට කුඹුරු ගොවීතැන්. යලට හේන්. කුඹුරු අක්කර දහයක් හා ගොඩ ඉඩම් අක්කර දෙකක්. ඒකේ එළවළු, අබ, මිරිස්, කව්පි වගේ බෝග. අවුරුදු විසි පහක් තිස්සේ මෙවැනි දිවි පෙවතකට හැඩ හැහුණු නෑගම්පහ පහළ වලස් වැව බණ්ඩාරනායක ගොවි මහත්තයා මහවැලි සංවර්ධන සැලැස්ම යටතේ අපේ ගොවි මහතුන් නව ආරකට හැඩ ගැහෙන අයුරු කදිමට විදහා දක්වන්නෙක්.

පහළ වලස්වැව මේ දවස්වල හරිම කඩිසර ගමක්. ගල්නෑව අනිත් ගම්මාන වගේමයි. අලුත් කුඹුරු. මහවැලි වතුර. ගොවි මහතුන්ගේ උද්යෝගය. නව නිවහන් ඉදි වෙනවා. මීහරක් බාන් එක්කම ට්‍රැක්ටර් ලියැදි වලින් පාරට ඇදෙනවා. බණ්ඩාරනායක මේ නවෝදය අතරෙන් කැපී පෙනුන කඩවසම්, නිරෝගී ගොවි මහතෙක්.

මෙහාට එන මහත්තුරු මුලින්ම අහන එකක් තමයි ඉස්සර ඉඩම් කොච්චර තිබුණද? දැන් අඩුද? කණගාටුවක් නැද්ද? මහවැලි ඉඩම් හොඳද? මමත් ඒ ගැනම කියලා කතාව පටන් ගන්නම්කෝ. ඉස්සර මට අක්කර දෙළහක් තිබුණා බුත්තියට. ඔය අතරේ හේන් එහෙමත් කළා. ඔය ඔක්කෝම වෙනුවෙන් අපේ පවුලට ලැබුණේත් අක්කර දෙකහමාරයි. ඉඩම් ප්‍රමාණය අනුව බැලුවම පාඩුවක්, කණගාටුවක්, ළමයිට දෙන්න ඉඩම් නැහැ. ඒවා ඇත්ත. ඒත් ඇත්තටම මගේ කණගාටුව තිබුණේ මුල් කන්නය වැඩ කර ගන්නකන් විතරයි. කාරනේ මේකයි. ඉස්සර වැව් වතුරෙන් තමයි ගොවි තැන. වැවේ වතුර නැත්නම් ගොවිතැනක් නැහැ. යලට කුඹුරු කිරීමක් වුනේ කලාතුරකින්. ඉතින් ගොඩ ඉඩමේ හේන්වල වැඩ එහෙම බොහෝම මහන්සියෙන් කරලා, කරදර වෙලා බෝග රැකගෙන තමයි ආදයමක් ගන්නේ අවුරුද්ද පුරාම සටනක් වගේ. මහ කන්නයක් වැරදුනොත් අවුරුද්දක්ම කෑව නොකෑවා වගේ.

දැන් එහෙම නැහැ. වතුර සහතිකේටම තියෙනවා. යල, මහ, දෙකම කුඹුරු. මුල් කන්නේ 1977 මහට මම බුසල් 160 ක විතර වී වික්කා ආදයම බැලුවම ඉස්සර අක්කර දහයෙන් ගත්ත ආදයමට වැඩියි. ඉස්සර නමට අක්කර දහයක් තිබුණට ඔක්කෝම වැඩ කරන්නේ නැහැ, බැහැ. වැවේ වතුර ටික අනුවයි. කන්නයේ

වැඩ කරන කුඹුරු ප්‍රමාණය තීරණය වන්නේ. අපේ යායේ ඉඩම් අයිති ගොවි මහත්තුරු ඔක්කොම එකතු වෙලා වැඩ කරන ප්‍රමාණය තීරණය කරනවා. වතුර ටික පොදුවේ කාටත් ප්‍රයෝජන වෙන හැටියට. ඒකයි ඉඩම් තිබුණ පලියටම ආදායමක් උපද්දන්න බැහැ කිව්වෙ. ඇතැම් කන්නවල කුඹුර නමට විතරයි. වගාවක් නැහැ

ඔය තත්වෙන් අපි කල් ගෙවද්දියි මහවැලි මණ්ඩලේ මෙහාට ඇවිත් ඉඩම් පවර ගත්තේ. ගමේ ඉ..ව වෙනස් වුනා. කාටත් දෙකහමාර ගණනේ ඉඩම්. ඇති නැති හැමෝටම. අපි කවුරුත් සම තත්වෙට වැටුණා, අපි ඉහළ වලස්වැවින් පහළ වලස් වැවට ආවා. මගේ කුඹුර තව ටිකක් දුරින්. මුල් කන්නේ ආදායම් ගත්තම කාගේත් දුක සැප තම තමන්ටම බලා ගන්න. පුළුවන් තත්වයක් උද වුනා ඒකයි අපේ සතුටට හේතු වුනේ. අපි වගේ ඉඩම් තිබ්බව අයගේ ඉඩමට තිබුණ තණ්හාව, පොදුවේ වැඩියෙන් ලැබෙන ආදායම නිසා තුරන් වුනා. මම මේ ගෙට අළුත් කැල්ලක් ගන්න එකේ වැඩත් පටන් ගත්තා.

ඉහළ වලස්වැව ඉන්න කාලේ මහත්තයගේ වගේම ගමේ රටේ තත්වය කොහොමද?

දැන් මට වයස 49 යි. කරිව්ලවැල ඉස්කෝලේ ජේස්වෙට යනකම් ගියා. 1942 දී තාත්තා නැති වුණා ඒ ගමන ඉතින් පවුලේ ඉඩම්වල වැඩට බැස්සා. අතරතුරේ පොඩි රස්සාවක් දෙකක් කළත් වැඩියෙන්ම ගොවිතැන. ඉඩම් නැති අය ඉඩම් අල්ලන් ගොවිතැන් කළා. මහට කුඹුරු යලට වැවේ වතුර තිබුණොත් කුඹුරු. නැත්නම් හේන් කොටනවා ඒ කාලේ අපි කන්නි මුරුංගා, දික්වී, සුලයි සම්බා, පච්ච පෙරුමාල් තමයි ඉහපු වී ජාති. අක්කරයට බුසල් තිහක් හතළිහක්.

ගොම පෝර කුඹුරට දම්මා. කුඹුරු වැඩට ගමේ හැමෝම උදව් වුනා. කුලිය මලිය නැහැ. කන්න බොන්න දෙනවා. දුකක්, කරදරයක් වගේ උදව් පදව් ඕන වෙලාවට ඒවා සොයා බලනවා. ලෙඩ රෝගත් එහෙමකට නැහැ, ඔය මන්තර, මඩුමල්, හිටවිලි වගේ කෙම් පහන් තමයි සාත්තුවට කළේ. මී හරක් දෙබානක් හොඳට ඇති මඩ වැඩට;

ඔය තත්වෙ හැට ගණන්වලදී වෙනස් වුනා. අළුත් වී ජාතිත් ආවා. මිනිසුන්ටත් ඉස්සරට වඩා ප්‍රශ්න. පුද්ගලිකත්වය ඉස්මතු වෙන්න පටන් ගත්තා. කුඹුරු වැඩටත් කුලියට සෙනග. ගමේ සාමූහික ගතිය වෙනස් වුනා, අළුත් වී වලට අපේ පරණ ගොවිතැන් ක්‍රම අල්ලන්නේ නැතුව වගේ; මුදල් ඉස්සරහට ආවා. මිරිස් වැවිල්ල අපේ පැත්තටත් ආවා ඒක එක අතකට හොඳයි. හැමෝම තම තමන්ගේ වැඩම බලා ගන්න තත්වයක්.

ඔය අතරේ මහත්තයාගේ ජීවිතේ වෙනසක් වුනේ නැද්ද? ඇයි නැත්තේ. මමත් 57 දී කසාදයත් බැන්ද, දැන් පුතෙකුයි, දුවලා තුන දෙනෙකුයි ඉන්නවා. හාමිනේ උගන්නනවා. ලොකු දුවටත් මහවැලියේ ඔටුන්න පැළඳි ගමෙන් අක්කර දෙකහමාරක් ලැබුණා. ඒවායේ තව ගොවිතැන් පටන් ගත්තෙ නැහැ.

අපි 75 දී පහළ වලස්වැවට ආවේ. ඇල කැපිල්ලේ වැඩ ඉවර වුනේ 74 නේ. 76 කැලෑ එළි කලා ඉඩම් වෙක්කර දුන්නා. මණ්ඩලෙන් රුපියල් හාරදහක් විතර ඒවාට වැය කළා. 77 මහට බුසල් 160 ක් විතර. ඉස්සර වගේ අක්කර දහයම වැඩ කළත් වැඩීම වුනොත් 200 යි. ඉස්සර හේන් කරා. දැන් ඉඩම් නැහැනේ. ඉස්සර අපි තල කව්පි, මිරිස්, සෝයා, ඉරිඟු එහෙමත් වැව්වා කන්නයකට ඕවායින් රුපියල් හාරදහක් විතර ගත්ත වාරත් තියෙනවා. දැන් යලට, මහට දෙකටම කුඹුරු නිසා ඒවා කරන්න ඕනකමක් නැහැනේ. දැන් හේන් ගොවිතැන අඩු වීගෙන යනවා ඒක නම් තරමක දුකක්. වළවළුවක්, එහෙමවත් හද ගන්න ඉඩක් නැති එක තමයි.

ගොවිතැන්වලට පරන කෙම් පහන් තවම කරනවාද? අපොයි නැහැ. අළුත් වී වලට ඒවා අහන්නේ නැහැ දැන් තෙල් බෙහෙත් ගහන්න ඕන. පේලියට වී දමලා. නැත්නම් විධර ක්‍රමයට.

ගොවි ආම්පන්න එහෙම? මී හරක් බාන හොඳටම ඇති අක්කර දෙක හමාරේ වැඩට. ට්‍රැක්ටර් නැතිවට කම් නැහැ. බැංකුවලින් ණය එහෙමත් දෙනවානේ. ණය ආපහු ගෙවනවාද? මෙහෙ හතළිහක් විතර ගත්තා. දහ දෙනෙක් විතර ණය ගෙව්වා. එයාලට යලටත් ණය ලැබුණා. මිනිස්සු ණය නොගෙවනනේ පුරුද්දට. ඔය තත්වය වෙනස් වෙයි. අළුත් දැනුම් වීණුම හමට එනවානේ.


# ගව්වක් දුරින් මහවැලි ජලකඳ ගැලුවත්....

කල්ලංවිය මුදියන්සේ මහත්මයාගේ ගෙදර බැලූ බැල්මටම සරුසාර රජරට ගොවි ගෙදරක සිරිය ගෙන්වනවා. වාම නිවහනක්. මීදුලේ වී බිස්ස. මුදියන්සේ මහත්තයා සමූපකාරේ ඉඳලා ගෙට ගොඩවුනා විතරයි එයාගේ ජීවිත කතාව කල්ලංවිය ගමේම කතාව ලෙස සලකන්නත් පුළුවන්. ඒත් ඒක මහවැලියෙන් පිබිදුණු අනෙක් පුරාණ ගම්මානවල වගේ ඉසුරුබර කතාවක් නෙවෙයි. අවට ලෝකය දියුණුව කරා පා නගද්දී තමන් පමණක් තිබූ අයුරින්ම දිවි ගෙවීමේ උරුමයක් ලබා ඇත්ද යන සාංකාව තහවුරු කරන එකක්. ආගිය කතාවලින් පස්සේ මුදියන්සේ මහත්මයා කතාව පටන් ගත්තා.

අවුරුදු හතර පහකින් කරලක් පැහුනේ ගිය මහේ. එතකන් අපි ජීවිතේ රැක ගත්තේ සාගත වැඩ කරලා. කුලී වැඩ වලින්. ගිය මහට නම් මහවැලි ඉඩම් අඳේට වැඩ කළා. මේ මහට ඒ ඉඩම් ලැබුනේත් නැහැ. ඒ මහවැලි වතුර එන්න කලින්ද?

අපිට මහවැලි වතුර නැහැ. ගව්වක් දුරින් මහවැලී වතුර මේ පැත්තට ගලනවා ඒත් අපට පිළිසරණක් නැහැ. අපි කුඹුරු කරන්නේ අහස් දියෙන්. කල්ලංවිය වැව පහළ අක්කර අසූවක් විතර තියෙනවා. පංගු කාරයෝ එකසිය විසි පහක් තරම්. මම අක්කර තුනක් වැඩ කරනවා මගේම කුඹුරු නෙවී. අපේ මහපවුලේ ඒවා.

මගේ අම්මා– ඩිංගිරි අම්මා ඉන්නවා. එයාට කොටස දෙනවා තව මගේ සහෝදර සහෝදරි යන්ගේ පවුල්. එයාලටත් උරුමය දෙනවා. ඉතිරියෙන් තමයි මගේ පවුල රැකෙන්නේ. දූලා පුතාලා පස් දෙනෙක්. ගිය කන්නේ බුසල් 150 ක් විතර ගත්තා. පවුල්වල කෑමට ගත්තාම අතට මුදලක් ගන්න විකුණන්න දෙයක් ඉතුරු වෙන්නේ නැහැ. ඉස්සර හේන් කළා. කුරහන් ගෝනි දහයක් දොළහක් කනන තියා ගත්තා. දූන් කැලෑ එළි වෙලා හේන් කරන්නත් අමාරුයි



මුදියන්සේ මහතා සිය මව, බිරිඳ හා මිණිබිරිය සමග

අපේ ප්‍රශ්නේ වතුර නැති කමයි. මහවැලිය ගව්වක් දුරින් ගැලුවට කල්ලංවියට වතුර දෙන්නේ නැහැ අපිට මහවැලි ඉඩම් ලැබුණේත් නැහ. ඉල්ලුම් පත්තර දම්මා. මහත්තුරුත් එක එක සැරේ විස්තර ලියන් යනවා. අපිටත් එක්කෝ වතුර දෙනවා නම් හොඳයි. නැත්නම් වතුර තියෙන තැනකින් ඉඩම. අපිට ඒ දෙකම නැතුවා හැඩයි.

අපිට නැතත් මේ ළමයින්ටවත් ඉඩම් තියෙන්න ඕනෙ. අපේ මහ පරම්පරාව. අපි අපේ දරුවන්. එයාලගේ දරුවෝ. සේරම කල්ලංවියේ මේ ඉඩමේ හිරකාරයෝ වගේයි. අපිට ගොඩ ඉඩමක් කියා තියෙන්නේ මේ ගේ තියෙන හරිය විතරයි ඒකේ වැවිල්ලක් නැහැනේ. අපි සේරම යැපෙන්න ඕන අර අක්කර තුනෙන්. ඒකටත් ඉතින් වතුර නැහැ. අනාගතය කොහොම වුනත් වතුර තියේ නම් අපටත් කලක් යාවී. ඒත් ඉතින්......... අපි හැමදම ඔයකතාව කිය කිය ඉන්නවා. මුදියන්සේ මහත්තයා හිස් අහසදෙස බැලුවා.

## අපටත් උරුමයක් තියෙනවා!



සාමා මෙණෙවිය

මට රස්සාවක් නෑ තමයි ඒ වුනත් අපනේ අරින්න කාලයක් මට නැහැ ගෙදර දෙරේ වැඩ තියෙනවා. අපේ ගමේ පොදු වැඩ ඕන තරම, අපි නිකම් ඉන්නේ නැහැ මහවැලි ඉඩම් ලැබුව පවුල්වල තරුණ පෙළට රැකියා නැහැ. කරන්න දෙයක් නැහැ කියලා කියනවා. උනන්දුවක් ඕන කමක් තියේ නම් මහවැලියේ වැඩත් ඕන තරම් බෝවතැන්නෙන් ගල්නෑවට ආ සාමාවතී මෙනෙවියයි අපට එහෙම කිව්වේ ගමට වැඩිය පහසුකම් මහවැලියෙන් ලැබෙන බවට ඇයත් එකඟයි.

ගෙදර දෙරේ වැඩවී මෙන්ම පවුලේ කුඹුරේ වැඩටද උදව්වෙන සාමා තොරේපේ ගම මහවැලි ස්වෙච්ඡා සේවිකාවකි. හැම ගෙදරකින්ම වී බුසල ගණනේ එකතු කරලා අපි ගමේ විහාරයේ වැඩ ඉවර කරගන්න යොද ගන්නවා. ගමේ පොදු වැඩ සියල්ලටම විහාරය මූලික ක ගන්නවා එතකොට ගමේ එකමුතුකම වැඩියි අපේ දහම් පාසැල කාන්තා සමිතිය මේ කටයුතුවල මුල්තැන් ගන්නවා. අපේ තරුණි යන්ට මැහුම් ගෙතුම්, සින්තා වැල් විවීම වගේ කටයුතු කාන්තා සමිතියෙන් කෙරෙනවා. දනට විහාර ශාලාව තමයි මේ හැම කටයුත්තටම යොද ගන්නේ විහාරය දියුණු කරගත්තම ගමේ හැම වැඩක්ම දියුණු වෙනවා.

ගමේ රටේ දියුණුවට කෙරෙන වැඩ පිරිමින්ට පමණක්ම සීමා වෙච්ච දේවල් නෙවෙයි ඔය හැම කටයුත්තකම ගැහැණුන්ටත් කොටසක් තියෙනවා. ඒ ටික කරන්න අපි නිතරම සූදනම්. මහවැලි මංඩලයේ ප්‍රජා සංවර්ධන අංශයේ මඟ පෙන්වීම අපට හොඳට ලැබෙනවා ඒක ධෛර්යයට හේතුවක් යැයිද පැවසූ සාමා මහවැලි නවෝදයේ පෙරමුණටම එන තරුණියක් බවට කිසිදු සැකයක් නැත.